# යහළුවන්ගේ එකමුතුකම

චිතුලි හෙසන්යා කරුණාරත්න



CamScanner

# යහළුවන්ගේ එකමුතුකම

චිතුලි හෙසන්යා කරුණාරත්න



CamScanner

| | |
|---|---|
| කෘතියේ නම | යහළුවන්ගේ එකමුතුකම |
| කතෘගේ නම | චිතුලි හෙසන්යා කරුණාරත්න |
| කතෘගේ වෙනත් කෘති | කඩුපුල් මල් පිපිලා<br>මගේ සුරතලා "ඩිංගා"<br>මා දුටු සිහිනය |
| පාසල | මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර |
| පන්තිය | 4 ශ්‍රේණිය A |
| කෘතිය පළ කරන දිනය | 2026-05-10 |
| ප්‍රථම මුද්‍රණය | 2026 |
| ලිපිනය | අංක : 07, "SASA" නිවාස සංකීර්ණය,<br>පල්ලේකැලේ, කුණ්ඩසාලේ |
| ISBN අංකය | 978-624-211-283-1 |
| මුද්‍රණය | චම්පා ස්ටෝර්ස්, දළදා වීදිය, මහනුවර. |




CS CamScanner

# පිදුම

මා ආදරෙන් හැදූ වැඩූ

දෙමාපියන්ටත්,,,

අකුරු කියා දුන්

ගුරු මෑණිවරුන්ටත්,

මෙම පොත

පුදමි.



CS CamScanner



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10



CamScanner

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

## ස්තූතිය

මට මේ පොත ලස්සනට ලියන්න කියල දීල උදව් කළ මගේ ඉස්කෝලේ සියලුම ගුරු මෑණිවරුන්ටත්, මගේ අම්මා, අප්පච්චි ඇතුළු පවුලේ සියලු දෙනාටත් මම ගොඩක් ස්තූති වන්ත වෙනවා.

චිතුලි හෙසන්යා කරුණාරත්න වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.


කතෘ - චිතුලි හෙසන්යා කරුණාරත්න

ලිපිනය - අංක : 07, "SASA" නිවාස සංකීර්ණය,
පල්ලේකැලේ, කුණ්ඩසාලේ

දුරකථන අංකය - 077-6644688





CamScanner

එකමත් එක කාලෙක පූසෙකුයි, තාරාවෙකුයි,
හාවෙකුයි හිටියා.






CamScanner



කැලයේ ලොකු ගසක් ළඟ තිබුණු පොඩි
වතුර විලක තාරාවා සිටියා. මෙයාලා හරි
සමඟියෙන් සෙල්ලම් කළා.







CamScanner



වතුර විල ළඟ තිබුණු ලොකු ගසේ
කුරුලු පවුලක් හිටියා.
හැමදාම කුරුලු අම්මයි
තාත්තයි  පැටවුන්ට
කෑම සොයාගෙන එන්න
පියඹලා යනවා.







එක දවසක් හාවා අඬාගෙන ආවා.

"යාළුවනේ, මම දැක්කා අර ගහ උඩ ඉන්න කුරුළු පැටවු දෙන්නා හොඳටම කෑ ගහනවා. මට හරි දුකයි" පූසා කිවුවා.





කුරුලු අම්මයි තාත්තයි කෑම හොයාගෙන
එන්න ගියපු වෙලාවේ ගහ උඩ
කූඩුවේ හිටපු කුරුලු පැටවෙක්
වතුරට වැටුණා.





පූසයි හාවයි ඉක්මනින් ගිහින්
ගහෙන් වැටුණු  කොළයක්
අරගෙන ඇවිත් වතුරට දැම්මා.





CamScanner




තාරාවා හිමීට කුරුලු පැටියාව
හොටෙන් තල්ලු කරලා කොළයට දැම්මා.
එතකොට කුරුලු අම්මායි, තාත්තායි
කෑම අරගෙන ආවා.





CamScanner





කුරුළු තාත්තා ඉක්මනින් පහළට
ඇවිත් කුරුළු පැටියාව හොටෙන්
අරගෙන කූඩුවේ තිබ්බා.





හොඳටම බඩගිනි වෙලා හිටපු කුරුලු
පැටව් කෑම ටික හිමීට හිමීට
කන්න පටන් ගත්තා. යාළුවෝ
තුන් දෙනා පහළ ඉඳලා ආසාවෙන්
බලාගෙන හිටියා.







කුරුලු අම්මයි, තාත්තයි පැටව් බේරා දුන් නිසා
යහළුවන්  තුන්දෙනාටම ගොඩාක් ස්තූති කළා.





මෙහෙම ටික දවසක් ගියාට පස්සේ

කුරුලු පැටව් ලොකු වෙලා


අහසට පියාඹලා යනවා

කුරුලු අම්මයි, කුරුලු තාත්තයි,

යහළුවෝ තුන්දෙනයි

ආසාවෙන් බලාගෙන හිටියා.







CamScanner



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

CamScanner